)සියලුම හිමිකම් ඇවිරිණි(
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

10 ශ්‍රේණිය **නාට්‍ය හා රංග කලාව** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 01 40 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
- පහත දැක්වෙන කවි / සංවාද ඇසුරෙන් අංක 01 05 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A සවන් දී පෙර රාම චරිතේ අසව්
පොරණ ලක්දිව උන්නු රාවණා
ආලෙවී ජානකී ගෙනගියේ තම රියේ
කියමි ඒ සංගීත බසින පෙර රාම චරිතේ අසව්

B ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට හිරුදෙව් අධිපති වන්නේ
රන්සිරි වසගෙන සුරත දරාගෙන තුරඟෙකු පිට වැඩ ඉන්නේ

C තෙමාලා රෙද්ද හැලියේ ඔබන කොට රවාලා පැනපි මහ ඉනිකුනා ගෙට
අසාලා පැනපි කොල්ලෝ දොර පිළට කපාලා දෙමුව තොටඹේ වීරයට

D යකැදුරා ගොජරෙ නොවේ උදරේ ලෙඩේ හැදිලා හත් අට මාසෙට වැඩී නැනේ ද?

E සත්ෂවු විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.
දේව දූතයා පින්වත් ස්වාමින් වහන්ස, විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මණ්ඩප ද්වාරයේහි මිනිස්සු ඇත.

01 ඉහත A ගීත කාණ්ඩය අයත් වන්නේ කවර නාට්‍ය සම්ප්‍රදායකට ද?
(1) නූර්ති (2) නාඩගම් (3) කෝලම් (4) සොකරි

02 ග්‍රහ පන්ති ශාන්තිකර්මයට අයත් අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D

03 බෞද්ධ පූජාකර්මයකට අයත් සංවාද/ගීත කාණ්ඩය අයත්වන්නේ,
(1) B (2) C (3) D (4) E

04 "C" අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යමය අවස්ථාව
(1) රිද්දි යාගයේ ය. (2) කොහොඹා කංකාරියේ ය.
(3) සුනියම් යාගයේ ය. (4) දෙවොල්මඩුවේ ය.

05 "D" නාට්‍යමය අවස්ථාව වනුයේ,
(1) වඩිග පටුන ය. (2) නානුමුර මංගල්‍යයේ ය.
(3) සූනියම් යක්ෂණියගේ අවතාර තුනය. (4) දරු නැලවිල්ල ය.

06 වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
(1) රූපණය (2) රසය (3) සජීවී බව (4) කථාවය

07 වේදිකා නාට්‍යයකට නැතුවම බැරි පුද්ගලයින් වන්නේ,
(1) වේදිකා පාලක, අධ්‍යක්ෂක (2) නළුවා, ආලෝකය
(3) අංග රචනය, රංග වස්ත්‍ර (4) නළුවා, ප්‍රේක්ෂකයා

08 නළුවෙකුට තම හඬ පැහැදිලිව භාවිතා කිරීම සඳහා සුදුසු රංග අභ්‍යාසයකි
(1) තාපන අභ්‍යාස (2) චිත්ත ඒකාග්‍රතා අභ්‍යාස
(3) ශිථිලකරණ අභ්‍යාස (4) ශ්වසන අභ්‍යාස

09 සිංහල හා ඉංග්‍රීසි වේදිකාවේ ප්‍රකට රූපණ ශිල්පිනියක් වන්නේ,
(1) අයිරාංගනී සේරසිංහ (2) මානෙල් ජයසේන
(3) සෝමලතා සුබසිංහ (4) කෞශල්‍යා ප්‍රනාන්දු

10 රූපණ කාර්යයේ දී දෑස් ප්‍රබලව යොදාගත යුතුය. මේ සඳහා ප්‍රගුණ කළ යුත්තේ,
(1) තාපන අභ්‍යාසයි. (2) දර්පණ අභ්‍යාසයි.
(3) ගස්දෙකේ යුද්ධයයි. (4) හිම කන්ද දියවීමේ අභ්‍යාසයයි.

11 නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ,
(1) කතාන්දර කීමයි. (2) රසෝද්වීපනයයි.
(3) උපදේශනයයි. (4) සංවාද භාවිතයයි.

12 නාට්‍ය පෙළක් ප්‍රබලවීමට අවශ්‍ය වන්නේ,
(1) රංග විධානය (2) උත්ප්‍රාසය (3) ගීතයන්ය (4) ගැටුමය

13 ''සංකරම්'' දමිළ නාට්‍ය රචනා කරන ලද්දේ,
(1) එස්. විද්‍යානන්දන් ය. (2) කුලන්දයි ශන්මුගලිංගම් ය.
(3) එස්. මෞනගුරු ය. (4) ඉලෙයියා පද්මනාදන් ය.

14 යම් කලා කෘතියක් ඉදිරිපත් කරන ආකෘති විලාශය
(1) ශෛලියයි. (2) සමාරෝපයයි.
(3) අනුකරණයයි. (4) සතර අභිනයයි.

15 ''බෙරහඬ නාට්‍යයට'' පාදක වූයේ,
(1) ග්‍රීක කොමඩි නාට්‍යයකි. (2) ග්‍රීක සැටර් නාට්‍යයකි.
(3) ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයකි. (4) ප්‍රහසනයකි.

16 ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වන වරණය තෝරන්න.
(1) සංගීතය, නවකතාව, නාට්‍යය (2) නර්තනය, සිනමාව, නාට්‍යය
(3) නර්තනය, සංගීතය, නාට්‍යය (4) ඔපෙරා, චිත්‍ර, නාට්‍යය

17 ප්‍රාසාංගික කලාවක් වන රූකඩ නාට්‍යයේ රූකඩ නටවන ශිල්පියා
(1) පොතේගුරු නම් වේ. (2) සූත්‍රධාර නම් වේ.
(3) කාරියකරවන රාළ නම් වේ. (4) කට්ටියකාරන් නම් වේ.

18 ''යෝසං ස්වභාවෝ ලෝකස්‍ය සුඛදුඃඛමන්විතඃ'' යන පාඨය අඩංගු වන්නේ,
(1) කාව්‍ය ශාස්ත්‍රයේ ය. (2) අලංකාර ශාස්ත්‍රයේ ය.
(3) දශරූපයේ ය. (4) නාට්‍ය ශාස්ත්‍රයේ ය.

19 වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රකට ඉංග්‍රීසි නාට්‍යකරුවන් දෙදෙනෙක් නම්
(1) ඊ. එෆ්. සී. ලුඩෝවයික්, මානෙල් ජයසේන
(2) රුවන්ති ඩී. චිගේරා, ඊ. එෆ්. සී. ලුඩෝවයික්
(3) ජෙරම් ඩී. සිල්වා, රුවන්ති ඩී. චිගේරා
(4) ඊ. එෆ්. සී. ලුඩෝවයික්, ජෙරම් ඩී. සිල්වා

20 ඔපෙරා නාට්‍ය කලාවේ වඩාත් කැපීපෙනෙන මාධ්‍යය වන්නේ,
(1) ගායනය (2) මුද්‍රා (3) රංගනය (4) නර්තනය

● පහත වගුව ඇසුරෙන් අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| තවත් උදෑසනක් | සුදු සහ කළු | සකල ජන | සෙක්කුව |
| අපට පුතේ මගක් නැතේ | පණ්ඩුකාභය | මොණරපිල් | වරෙන්තුව |
| අහස් මාළිගා | පුස්ලෝඩං | ස්වර්ණ හංස | මකරරාක්ෂ |
| ජනේලය | සුභ සහ යස | ස්වර්ණමාලි | චරන්දාස් |

21 නාට්‍ය නිෂ්පාදනයට රංගනයෙන් එක ලෙස දායකත්වය සැපයූ නාට්‍යකරුවෙකුගේ නිර්මාණ අයත් අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D

22 ''A'' අක්ෂරය අයත් නාට්‍යකරුවා
(1) පරාක්‍රම නිරිඇල්ල මහතා ය. (2) විජය නන්දසිරි මහතා ය.
(3) හෙන්රි ජයසේන මහතා ය. (4) බන්ධුල ජයවර්ධන මහතා ය.

23 ''සයිමන් නවගත්තේගම'' නාට්‍යකරුවාට අයත් අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D

24 බන්දුල ජයවර්ධන මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කාණ්ඩය වන්නේ,
(1) A (2) B (3) C (4) D

25 පරාක්‍රම කිරිඇල්ල මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කාණ්ඩය වන්නේ,

(1) A (2) B (3) C (4) D

26 ජන කරළිය නම් ජංගම රඟමඬල ආරම්භ කිරීමේ දායකත්වය සැපයූ නාට්‍යවේදියා

(1) හෙන්රි ජයසේන මහතා ය. (2) ජයලත් මනෝරත්න මහතා ය.

(3) පරාක්‍රම නිරිඇල්ල මහතා ය. (4) බන්ධුල විතානගේ මහතා ය.

27 රංගනය, රංගවස්ත්‍ර නිර්මාණය, නර්තනය, අධ්‍යක්ෂණය ආදිය මගින් වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වය ලබාදුන් නාට්‍ය ශිල්පිණියක් වන්නේ,

(1) මානෙල් ජයසේන මහත්මිය (2) අනුලා බුලත්සිංහල මහත්මිය

(3) ලලිතා සරච්චන්ද්‍ර මහත්මිය (4) රත්නා ලාලනී මහත්මිය

28 1966 දී වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසි හාස්‍ය මුසු රංගනයට වඩාත් ප්‍රකට නාට්‍යවේදියෙකි

(1) විජේරත්න වරකාගොඩ (2) හෙන්රි ජයසේන

(3) විජය නන්දසිරි (4) ශ්‍රියන්ත මෙන්ඩිස්

29 මහාචාර්ය නෝබට් ජේ. චයර් නම් විදේශීය නාට්‍යකරුවාගේ නාට්‍ය වැඩමුළුවක් හරහා නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසි නාට්‍යකරුවෙකි

(1) විජේරත්න වරකාගොඩ (2) ශ්‍රියන්ත මෙන්ඩිස්

(3) ජැක්සන් ඇන්තනී (4) විජය නන්දසිරි

30 ''රතුහැට්ටකාරී'' නාට්‍යයට රංගනයෙන් දායක වූ නාට්‍ය ශිල්පිණියකි.

(1) අනුලා බුලත්සිංහල (2) හේමලතා සුභසිංහ

(3) මානෙල් ජයසේන (4) රත්නා ලාලනී

31 සිංහල, ඉංග්‍රීසි වේදිකා නාට්‍යවල රඟපෑ නාට්‍යවේදියෙකි

(1) විජය නන්දසිරි (2) එච්. ඒ. පෙරේරා

(3) ඩග්ලස් රණසිංහ (4) ජැක්සන් ඇන්තනී

32 දික්තල කාලගෝල නාට්‍යයට වස්තු විෂය සපයාගෙන ඇත්තේ,

(1) උම්මග්ග ජාතකයෙනි. (2) සද්ධර්මරත්නාවලියෙනි.

(3) ලෝමහංස ජාතකයෙනි. (4) චුල්ලධනුද්ධර ජාතකයෙනි.

33 නාඩගම් රංග ශෛලිය සඳහා යොදාගන්නා ලද සංගීතය

(1) සරල ගි තනුය. (2) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය

(3) දේශාභිමානී ගීය (4) උත්තර භාරතීය හින්දුස්ථානී සංගීතය

34 ''කාරියකරවන රාළ''

(1) වෙස්මුහුණු පළඳියි. (2) නාට්‍යයේ චරිත හඳුන්වාදෙයි.

(3) කෝලම් නාට්‍යයේ ස්ථාවර පාත්‍රයෙකි. (4) නූර්තිවල චරිතයකි.

35 පහත නාට්‍ය සම්ප්‍රදායන් අතුරින් ජන නාටකවලට අයත් නොවන්නේ මින් කවරේද?

(1) සොකරි (2) කෝලම් (3) නූර්ති (4) ඔඩිසි

36 කෝලම් රංගභූමිය

(1) කරළයයි. (2) කමතයි.

(3) තානායම්පොළයි. (4) නූතන වේදිකාවයි.

37 සොකරි නාට්‍ය රඟදක්වන ලද්දේ

(1) ප්‍රොසීනියම් වේදිකාවේ ය. (2) කමතේ දී ය.

(3) සබය නම් ස්ථානයේ ය. (4) කැරකෙන වේදිකාවක ය.

38 බලිවාලා නම් නාට්‍ය කණ්ඩායම හඳුන්වාදුන් නාට්‍ය විශේෂය

(1) නූර්ති (2) කෝලම් (3) නාඩගම් (4) සුබාන්ත

39 ''නෘත්ත'' යනු

(1) භාව ප්‍රකාශනයෙන් තොර නර්තනයයි.

(2) සතර අභිනයට සම්බන්ධයි.

(3) භාව ප්‍රකාශන නර්තනයයි.

(4) විශේෂ නර්තනයකි.

40 ගුණසේන ගලප්පත්ති විසින් ''යෙර්මා'' නාට්‍යය ඇසුරෙන් අනුවර්තනය කරන ලද නාට්‍යයකි

(1) සඳකිඳුරු (2) පුස්ලෝඩං (3) මූදු පුත්තු (4) දේවතා එළි

(1 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 පහත දී ඇති සංවාද කොටස ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බහුබූත කෝලම — කුමක් කරන්නට දන සැවොමා
යස නැටුම් නටන්නට දනිමි මෙමා
රටින් තොටින් එන දන සැවොමා
අපේ නැටුම් බලා යති වී අරුමා

පොතේගුරු — සරණයක් කරගන්ට ඇවිද නෙක නෙක තැනා
තරුණියක් දැකල එක් නිවාසෙක නැවතුනා
සත්වසක් කඹුට ගෙය මෙහෙවරය කරමිනා
ගත් ලියත් සමග කාලගෝලා නික්මුනා
(කාලගෝල දිත්තල ගමනින් පැමිණේ.)

කාලගෝල — මොකද ඔහේලා හිනැහෙන්නේ, ........

කාලගෝල සිංදුව — ආලේ බැන්ද මාගේ රම්‍යවන්
අවුරුදු සතක් දුකින මෙහෙවර කළා මෙමා
ගත් ලඳුන් මගේ ඇගේ රූපේ බෝ අගේ
ආලේ බැන්ද මාගේ රම්‍යවන් ......

දික්තල — ඇන්නැවේ මේ මල කෝලම්
පාරේ යන්නට බැහැ මුන්දෑ සමගින් .....

(1) ඉහත සංවාද අයත් නාට්‍ය නිර්මාණය වන්නේ කුමක් ද? (ල. 01)
(2) මෙම නාට්‍යයේ වස්තු විෂය සපයාගෙන ඇත්තේ කිනම් ජාතකයක් මගින් ද? (ල. 01)
(3) මෙම නාට්‍යයේ රචකයා ලෙස සැලකෙන්නේ කවුරුන් ද? (ල. 02)
(4) මෙම නාට්‍යය කිනම් ජන නාටකයක් හා සම්බන්ධ ද? (ල. 01)
(5) මෙහි සඳහන් රංග විදානය ලියන්න. (ල. 01)
(6) මෙහි සඳහන් චරිත සංඛ්‍යාව කොපමණ ද? (ල. 01)
(7) නාඩගම් ශෛලියේ ලක්ෂණයක් සඳහන් කරන්න. (ල. 02)
(8) සරණයක් යන්නට සමානාර්ථ පදයක් ලියන්න. (ල. 01)
(9) මෙම නාටකයට අයත් ගීත කොටස සම්පූර්ණයෙන් ම ලියා දක්වන්න. (ල. 02)

02 (1) නාට්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන පරිදි නාට්‍ය ශෛලීන් 2 නම් කරන්න. (ල. 03)
(2) එම ශෛලීන්ගේ විශේෂතා උදාහරණ ගෙන පහදන්න. (ල. 03)
(3) එම ශෛලීන්ගෙන් නාට්‍ය 2 ක් ගෙන චරිත නාම සහිතව එම ශෛලීන් ප්‍රකට කළ ආකාරය විස්තර කරන්න. (ල. 06)

03 (1) නෘත්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 03)
(2) නෘත්ත නෘත්‍යයේ සමාන, අසමානතා ලියන්න. (ල. 03)
(3) නෘත්ත, නෘත්‍ය, නාට්‍යයෙන් වෙනස්වන අයුරු පහදන්න. (ල. 06)

04 (1) ඩඩ්ඩිසි සූනියම් යක්සයා පුද ලබන ශාන්තිකර්මයක් නම් කරන්න. (ල. 03)
(2) එම ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශය නම් කරන්න. (ල. 03)
(3) එහි අඩංගු නාට්‍යමය පෙළ පාලිය විස්තර කරන්න. (ල. 06)

05 (1) අංග රචනයේ දී මුහුණ බෙදෙන කොටස් 6 නම් කරන්න. (ල. 03)
(2) අංග රචනයේ දී භාවිතා වන අමුද්‍රව්‍ය 5 ක් නම් කරන්න. (ල. 03)
(3) වේදිකා නාට්‍යයක අංග රචනය කිරීම සඳහා ඔබට පැවරුණහොත් එය ඉටුකිරීමට අනුගමනය කරන ක්‍රියාවලිය අනුපිළිවෙලින් ලියන්න. (ල. 06)

06 (1) නාට්‍ය පෙළක් රංගයක් බවට පත්කිරීමේ ප්‍රධානියා කවරේ ද? (ල. 03)
(2) නළුවරණය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ල. 03)
(3) නාට්‍ය පෙළක් රංගයක් බවට පත්කිරීමේ අනුපිළිවෙල ලියන්න. (ල. 06)

07 අනාමික තේමාවක් රැගත් නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. නාට්‍යෝචිත ව හා රංග විධාන සහිතව පෙළ නිර්මාණය කරන්න. (ල. 12)